1. පහත දැක්වෙන ඡේදය කියවන්න.

වෙල් ඉපනැල්ලේ සිටින රාජා දුටු සමන්ට දැනුණේ සතුටකි. රාජා සමග සෙල්ලම් කිරීමට නොඉවසිලිමත් වූ සමන් එහා මෙහා කුඹුර දෙසට දිව ගියේ ය. වර්ණවත් කුරුල්ලකු මෙන් අහසේ පාවෙන සරුංගලයක් දුටු සමන් ඉක්මනින් සතුටට පත් විය. සරුංගලයේ නූල කැඩී ඈතට යන බව තමා සමීපයට පැමිණි සමන්ට රාජා පැවසුවේ ශෝකයෙනි. අහසේ ඈතට පාවී යන සරුංගලය දෙස බලා සිටි රාජාගේ දෑස්වල කඳුළු දුටු සමන් "අපි නව සරුංගලයක් හදමු" යැයි යෝජනා කළේ ය.

- ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(i) සමන් කුඹුර දෙසට දිව ගියේ කුමක් සඳහා ද? ..........

(ii) 'ඉක්මනින්' යන්නට අර්ථය දීමට ඡේදයේ යොදා ඇත්තේ කුමක් ද? ..........

(iii) සමන් සරුංගලය දුටුවේ කුමක් ලෙස ද? ..........

(iv) 'ශෝකය' යන්නට විරුද්ධ අර්ථයක් දැක්වෙන පදය ලියන්න. ..........

(v) රාජාගේ සරුංගලය අහසේ ඈතට පාවී ගියේ කුමක් නිසා ද? ..........

(vi) "අපි නව සරුංගලයක් හදමු" යැයි සමන් යෝජනා කළේ ඇයි?

..........

2. ප්‍රාණවාචී, ඒකවචන, අතීත කාල ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ගියේ ය. (2) දුවන්නේ ය. (3) දිළිසුණේ ය.

3. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

පුවරුවේ / කියවීමට / පුරුදු / නිර්මාණ / දැ / ඇති / වෙමු

..........

4. පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් '✓' ලකුණ ද වැරදි නම් '✗' ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(i) නංගී උදෑසන ම පාසලට ගියා ය. (.........)

(ii) ඒ අහසේ තරු බැබළුණේ ය. (.........)

(iii) හංසයෝ විලෙහි පිහිති. (.........)

(iv) තාත්තා උදෙන් ම අවදි වූහ. (.........)

5. ගැළපෙන විරාම ලකුණු යොදන්න.

| |
|---|
| හොඳට ඇහුම්කන් දීලා කිවුව වැඩේ කරන්න පුරුදු වෙන්න ගුරුතුමිය පැවසුවා ය |

6. (i) පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කිරීමට සුදුසු වචන හිස්තැනෙහි ලියන්න.

ආඩි හත්දෙනාගේ .................................... වගේ.

(ii) පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.

නුසුදුස්සාට තනතුරු දීමෙන් අහංකාර වීම

..........

[තුන්වැනි පිටුව බලන්න.

විභාග අංකය : ..........................................

7. පහත සඳහන් එක් එක් වාක්‍යයෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) අප රටෙහි (සෛලමය/ශෛලමය) ප්‍රතිමා බොහෝ ඇත.

(ii) ඩෙංගු රෝගය පිළිබඳ ව පැවැත්වූ (දේශනය/දේශණය) ඉතා අගනේ ය.

8. පහත සඳහන් වාක්‍යය වර්තමාන කාලයට හරවා ලියන්න.

ඔවුහු සෙල්ලම් කළෝ ය.

..........................................................................................................................................

9. ස්ත්‍රී ලිංග පදය ලියන්න. යහළුවා : ..........................................

10.

> සමන්තැන්න විදුහල
> 2020.10.05
>
> සැපවේවා!
>
> දයාබර උවිඳු,
>
> ඔබ අසනීප වී රෝහලේ සිටින බව අපට දැනගන්න ලැබුණා. ඒ ගැන කණගාටුයි. ඔබට දැන් තරමක් සුවය ලැබී ඇති බව ගුරුතුමී අපට පැවසුවා. පාසල් වැඩ අතපසු වීම ගැන කණගාටුවෙන්න එපා. ඔබ සනීප වී පාසල් පැමිණි පසු අපි ඔබට උදව් කරන්නම්.
>
> ඔබට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමු!
>
> මෙයට,
> පහ ශ්‍රේණියේ යහළුවන්

(i) මෙම ලිපිය ලියා ඇත්තේ කාටද? ..........................................

(ii) මෙම ලිපිය ලියා ඇත්තේ කවුරුන් විසින් ද? ..........................................

(iii) යහළුවන් ප්‍රාර්ථනා කළේ කුමක් ද? ..........................................

11. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.

(i) Rainbow : .................................... (ii) Daughter : ....................................

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය, **ඉංග්‍රීසි** අකුරෙන් ම ලියන්න.

(i)



....................................

(ii)



....................................

13. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) a / This / playground / is : .......................................................... .

(ii) am / my / helping / I / mother : .......................................................... .

14. "වංගි" යන දෙමළ වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.


..........................................................................................................................................

[හතරවැනි පිටුව බලන්න.

15. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

අත් සෝදන්න : ..............................................................

16. ගණක රාමුවේ නිරූපිත සංඛ්‍යාව, ඉලක්කමෙන් ලියන්න.




: ..............................................................

17. පහත දී ඇති සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

7050 : ..............................................................

18. පහත සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට ලියන්න.

8607 , 6078 , 8706

.................., .................., ..................

19.

| | | |
|---|---|---|
| 1 | | 9 |
| | 5 | |
| 13 | | 17 |

කොටුවේ ඇති සංඛ්‍යා සියල්ල ම යොදාගෙන පොදු අන්තරය 4 වන සංඛ්‍යා රටාවක් ගොඩනගන්න.

1 , ......., ......., ......., .......

20. එක්තරා පාසලක ගැහැනු ළමයි 1046 දෙනෙක් ද පිරිමි ළමයි 938 දෙනෙක් ද සිටිති.


(i) පාසලේ සිටින මුළු ළමයින් සංඛ්‍යාව කීය ද?

..............................................................

(ii) එම පාසලේ පිරිමි ළමයින්ට වඩා ගැහැනු ළමයින් කොපමණ සිටිත් ද?

..............................................................

21. ඉදිරියෙන් දී ඇති රූපයෙන් $\frac{3}{4}$ ක් (පැන්සලෙන් හෝ පෑනෙන්) පාට කරන්න.



22. පැය 24 ඔරලෝසුවේ 13 : 30 ලෙස පෙන්වන වේලාව, පැය 12 ඔරලෝසුවේ වේලාවෙන් කීය ද?

..............................................................

23. 416, 4 න් බෙදූවිට පිළිතුර කුමක් ද? : ..............................................................

24. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | මිල දී ගත් ප්‍රමාණය | කිලෝග්‍රෑම් එකක මිල | | වටිනාකම | |
|---|---|---|---|---|---|
| | | රුපියල් | සත | රුපියල් | සත |
| හාල් | 3 kg | 95 | 00 | (i) .................. | .................. |
| පරිප්පු | 500 g | (ii) .................. | .................. | 87 | 50 |
| මුළු මුදල | | | | 372 | 50 |

25. එක් ටැංකියක ජලය ලීටර 10 මිලිලීටර 500 ක් ද තවත් ටැංකියක ජලය ලීටර 8 මිලිලීටර 600 ක් ද ඇත. ටැංකි දෙකෙහි ජල ප්‍රමාණ අතර වෙනස කොපමණ ද?

ලීටර .............. මිලිලීටර ..............

26. මල්ලක හාල් 2 kg 350 g ක් තිබුණි. එයට තවත් හාල් 1 kg 750 g ක් දමන ලදි. දැන් මල්ලේ ඇති හාල්වල මුළු බර කොපමණ ද?

.............. kg .............. g

27. A නගරයේ සිට B නගරයට දුර 5 km 750 m වේ. B නගරයේ සිට C නගරයට දුර 7 km 500 m වේ. A නගරයේ සිට B නගරය හරහා C නගරයට ඇති මුළු දුර කොපමණ ද?


.............. km .............. m

28. රූපයේ දැක්වෙන ඝනවස්තුවේ නම ලියන්න.



..............................

29. පැයක් තුළ මාර්ගයක ධාවනය වූ වාහන පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ.




මාර්ගයෙහි ගමන් කරන ලද මුළු වාහන සංඛ්‍යාව කීය ද? ....................

- අංක **30** සිට **59** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න.**

30. 'නිදහස් අධ්‍යාපනයේ පියා' ලෙස හඳුන්වනුයේ,
   (1) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මැතිතුමා ය.
   (2) ආචාර්ය ටී.බී. ජායා මැතිතුමා ය.
   (3) ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ය.

31. බෝ **නොවන** රෝගයකට උදාහරණයක් වන්නේ පහත සඳහන් කුමක් ද?
   (1) කොළරාව  (2) දියවැඩියාව  (3) ඩෙංගු

32. පාද සහිත සතුන් පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
   (1) බල්ලා, ගැඩවිලා, කොකා  (2) බළලා, නයා, කුකුළා  (3) හිරවා, තාරාවා, ඉබ්බා

33. වවුලාගෙන් මිනිසාට ඇති ප්‍රයෝජනයක් වන්නේ,
   (1) රාත්‍රී කාලයෙහි සැරිසැරීමයි.  (2) ශබ්ද නිකුත් කිරීමයි.
   (3) බීජ ව්‍යාප්ත කිරීමයි.

[හයවැනි පිටුව බලන්න.

**34.** අප ආහාරයට ගන්නා මල් වර්ගයක් දැක්වෙන රූපය කුමක් ද?


(1)


(2)


(3)

**35.** සර්ව භක්ෂක සතුන් යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) ශාක කොටස් පමණක් ආහාරයට ගන්නා සතුන් ය.
(2) සත්ත්ව කොටස් පමණක් ආහාරයට ගන්නා සතුන් ය.
(3) ශාක හා සත්ත්ව කොටස් දෙවර්ගය ම ආහාරයට ගන්නා සතුන් ය.

**36.** ජලවාෂ්පයෙන් තැම්බීම මගින් සකස් කරගනු ලබන ආහාර වර්ගයක් වන්නේ කුමක් ද?
(1) ආප්ප (2) ඉඳි ආප්ප (3) රොටී

**37.** මෙම උපකරණය භාවිත කෙරෙන්නේ කුමක් සඳහා ද?



(1) සුළං හමන දිශාව දැනගැනීමට
(2) සුළගේ වේගය මැනීමට
(3) සුළගේ ජලවාෂ්ප ප්‍රමාණය සෙවීමට

**38.** ගෙවත්තේ බෝග පැළ අතර දාස් පෙතියා ශාක වගා කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
(1) ගෙවත්තට අලංකාරයක් එක් කිරීමයි.
(2) බෝගවලට හානිකරන කෘමීන් පළවා හැරීමයි.
(3) ගෙවත්තෙහි ඉඩකඩ උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමයි.

**39.** හිරු එළියෙන් ලැබෙන උණුසුම නිසා ජලය වාෂ්පීකරණය වීම ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවක් වන්නේ,
(1) පලතුරුවලින් ජෑම් සැකසීමයි.
(2) මාළුවලින් කරවල සැකසීමයි.
(3) එළකිරිවලින් බටර් සැකසීමයි.

**40.** ලෝහ හැන්දකට ජලය ස්වල්පයක් දමා රූපයේ දැක්වෙන ආකාරයට ඉටිපන්දම් දැල්ලකට අල්ලනු ලැබේ. මෙහි දී ජලයට සිදු වන්නේ කුමක් ද?



(1) වර්ණය වෙනස් වීම
(2) පිපිරීමක් ඇති වීම
(3) රත් වීම

**41.** පුස්තකාලයක් තුළ දී සිදු **නොකළ** යුතු ක්‍රියාවක් වන්නේ කුමක් ද?
(1) පොත් කියවීම නිශ්ශබ්දව සිදු කිරීම
(2) කියවූ පොත් නියම කර ඇති ස්ථානවල තැබීම
(3) කියවන පොත්වල විවිධ සලකුණු යෙදීම

**42.** මාර්ග ආලෝක සංඥා පුවරුවක රතු පැහැති බල්බය දැල්වී ඇති විට එයින් හඟවනු ලබන්නේ,
(1) වාහනය නවත්වන ලෙසයි.
(2) වාහනය ධාවනය කරන ලෙසයි.
(3) වාහනය ධාවනයට සූදානම් වන ලෙසයි.

**43.** පරිසර දූෂණය අවම වන්නේ,
(1) සූර්ය කෝෂ මගින් විදුලි බලය ලබා ගැනීමේ දී ය.
(2) ගල් අඟුරු මගින් තාප විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීමේ දී ය.
(3) පෙට්‍රල් සහ ඩීසල් භාවිත කර වාහන ධාවනය කිරීමේ දී ය.

[හත්වැනි පිටුව බලන්න.

44. අයිස් කැට භාවිත කරනු ලබන අවස්ථාවකි,
(1) පළාවර්ගවල නැවුම් බව රැක ගැනීම.
(2) වියළි ධාන්‍ය නරක් නොවී තබා ගැනීම.
(3) මාළු නරක් නොවී තබා ගැනීම.

45. මිනිසා සන්නිවේදනය සඳහා අතීතයේ යොදා ගත් ක්‍රමයක් හා වර්තමානයේ යොදා ගන්නා ක්‍රමයක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) දුරකථන භාවිතය සහ විද්‍යුත් තැපැල
(2) ගිනිමැල ගැසීම සහ දුරකථන භාවිතය
(3) අණ බෙර ගැසීම සහ ගිනිමැල ගැසීම

46. පාපැදියකට සම්බන්ධ කර ඇති ඇති රෝද හා දම්වැල් කට්ටලය වඩාත් උපකාරී වන්නේ,
(1) පාපැදියේ සමබරතාව රැක ගැනීමටයි.
(2) පා පැදිය අවශ්‍ය දිශාවට හැරවීමටයි.
(3) අඩු වෙහෙසකින් පාපැදිය පැදගෙන යාමටයි.

47. උතුර, වයඹ හා සබරගමුව යනු ශ්‍රී ලංකාවේ,
(1) දිස්ත්‍රික්ක තුනකි. (2) පළාත් තුනකි. (3) නගර තුනකි.

48. දණ්ඩ චුම්බක දෙකක් කෙළවර එකිනෙකට ළං කරන ලදී. එවිට චුම්බක දෙක එකිනෙකට ඇද ගන්නා බව දක්නට ලැබුණි. ඒ සඳහා චුම්බක දෙක ළංකර තැබිය යුතු නිවැරදි ආකාරය දැක්වෙන රූපය කුමක් ද?
(1) [S N][N S] (2) [S N][S N] (3) [N S][S N]

49. පාවහන් ගලවා නිවසට ඇතුළුවීම යහපත් සෞඛ්‍ය පුරුද්දක් වන්නේ,
(1) පාවහන් ඉවත් කිරීම නිසා පාදවලට පහසුවක් දැනෙන නිසා ය.
(2) පාවහන්වල ඇති විෂබීජ නිවස තුළට ඇතුළුවීම වැළකෙන නිසා ය.
(3) පසු දිනට පාවහන් සොයා ගැනීම පහසු වීම නිසා ය.


50. පහත දැක්වෙන ස්ථාන අතුරෙන් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත්තේ කුමක් ද?
(1) සිංහරාජ වනාන්තරය (2) යාල අභය භූමිය (3) පේරාදෙණිය උද්භිද උද්‍යානය

51. වනාන්තරයක ඇවිදීමේ දී මාලිමාවක් රැගෙන යාම වැදගත් වන්නේ ඇයි?
(1) දුර සිටින සතුන් නිරීක්ෂණයට
(2) යා යුතු දිශාව සොයා ගැනීමට
(3) වටිනා පාෂාණ හඳුනා ගැනීමට


52. පහත ආහාර අතුරෙන් ශරීරයට ශක්තිය ලබා ගැනීම සඳහා අවශ්‍ය වන ආහාරය කුමක් ද?
(1) බත් (2) මෑ කරල් (3) ගොටුකොළ

53. මාෂ බෝග ගණයට අයත් පරිප්පු වෙනුවට යොදාගත හැකි ආහාරයකි.
(1) බතල (2) මුං ඇට (3) වට්ටක්කා


54. වියළි කෝෂවලට සම්බන්ධක කම්බි මගින් බල්බ සම්බන්ධ කර ඇති අවස්ථා තුනක් පහත දැක්වේ. බල්බය **නොදැල්වෙන්නේ** පහත සඳහන් කුමන අවස්ථාවේ ද?



(1)



(2)



(3)


**55.** දුර දිග නොබලා සිදුකරන මිනිස් ක්‍රියාකාරකම් නිසා ආපදා සිදුවිය හැකි අවස්ථාවක් වන්නේ,
(1) අකුණු ගැසීම නිසා වගා විනාශ වීමයි. (2) සුළි සුළං හමද්දී නිවෙස් කැඩී බිඳී යාමයි.
(3) කඳුවල ඇති පස් කැපීම නිසා නාය යාම් ඇති වීමයි.

**56.** 'පළිද කෙළිය' යනු,
(1) බෙහෙත් සකසන ක්‍රමයකි.
(2) ජන ක්‍රීඩාවකි.
(3) සන්නිවේදන ක්‍රමයකි.

**57.** ශ්‍රී ලංකාවට ඒකදේශීක පක්ෂියකු සහ ඒකදේශීක ක්ෂීරපායී සතකු පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වලි කුකුළා හා දිවියා (2) වලි කුකුළා හා කළු වඳුරා
(3) හබන් කුකුළා හා යක් කටුස්සා

**58.** "රන් දැකැති ගෙන නිති සැරසෙනවා
රත්රන් පටි ඉන වට දිලිසෙනවා"
මෙය
(1) පාරු කවියකි. (2) ගොයම් කවියකි. (3) පතල් කවියකි.

**59.** රූපයේ දක්වා ඇත්තේ ජලය පුරවා ඇති බෝතලයකි. මෙහි ජලය මගින් ඇති කරන පීඩනය වැඩිම ස්ථානය කුමක් ද?




(1) A
(2) B
(3) C

**60.** "පාසල් වසා තැබූ කාලය මා ගත කළ අයුරු" යන්න මාතෘකාව කරගනිමින් වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

1. ....................................................................................................

....................................................................................................

2. ....................................................................................................

....................................................................................................

3. ....................................................................................................

....................................................................................................

* * *